රිවිර. 2019. 07. 09 පිටුව 9

(26)

# 2018දී රැකියා සඳහා 211,459දෙනකු විදේශගත වෙලා

## ස්ත්‍රීන්ගෙන් සියයට 79.4ක්ම ගෘහ සේවිකාවෝ

**බද්දේගම - ඕ. කමලනාථ**

2018 වසරේදී රැකියා සඳහා 211,459දෙනකු විදේශගතව ඇතැයි ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත පෙන්වා දෙයි. ඉන් 129,774 දෙනෙක් පුරුෂයන් වන අතර 81,685 දෙනෙක් ස්ත්‍රීන්ය. ශ්‍රම බල තත්ත්වය අනුව වර්ගීකරණයේදී ගෘහ සේවිකාවන් ලෙස 64,938 දෙනකුද, නුපුහුණු ශ්‍රමිකයන් ලෙස 51,719 දෙනකුද, අර්ධ පුහුණු ශ්‍රමිකයන් 2,770 දෙනකුද, පුහුණු ශ්‍රමිකයන් ලෙස 67,053 දෙනකුද, ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි සඳහා 10,021 දෙනකුද, මධ්‍යම මට්ටම යටතේ 7,748 දෙනකුද, වෘත්තීය මට්ටම යටතේ 7,210 දෙනකුද රැකියා සඳහා 2018 වසරේදී විදේශගතව සිටී.

රැකියා සඳහා විදේශගත වන කාන්තාවන්ගෙන් බහුතරයක් ගෘහ සේවිකාවන්ය. 2018 වසරේ දත්ත අධ්‍යයනය කිරීමේදී රැකියා සඳහා විදේශගතවූවන්ගෙන් 81,685 දෙනකු ස්ත්‍රීන්ය. ඉන් 64,938 දෙනෙක් ගෘහ සේවිකා තනතුරු සඳහා විදේශගත වී තිබේ. ඒ අනුව 2018 වසරේ රැකියා සඳහා විදේශගත වූ කාන්තාවන්ගෙන් සියයට 79.4ක් ගෘහ සේවිකාවන්ය.